පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.12.05 පැය 2320 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2169/25 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**පහරදීමකට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීම - කඩුවෙල පොලිස් ස්ථානය.**

දිවයින පුරා පැවති අයහපත් කාලගුණ තත්ත්වයෙන් අවතැන්වූ පිරිස් වෙත සහන සැලසීම සඳහා බෝට්ටුවක් රැගෙන බලපිටිය ප්‍රදේශයේ සිට කඩුවෙල ප්‍රදේශයට පැමිණි බවට සඳහන් කරන පුද්ගලයෙකු තමාට පිරිසක් විසින් පහරදුන් බවට ප්‍රකාශ කරන වීඩියෝවක් මේ දිනවල සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ සංසරණය වෙමින් පවතී.

2025.12.01 වන දින කඩුවෙල පොලිස් වසමේ ගංවතුරින් අවතැන්වූවන් සඳහා සහන සැලසීමට බලපිටිය ප්‍රදේශයේ සිට කඩුවෙල ප්‍රදේශයට පැමිණි පුද්ගලයෙකු පැහැරගෙන ගොස් පහරදීමක් සම්බන්ධයෙන් එම පුද්ගලයා විසින් 2025.12.03 වන දින අම්බලන්ගොඩ පොලිස් ස්ථානයට පැමිණිල්ලක් සිදු කර ඇත. ඒ සම්බන්ධයෙන් කඩුවෙල පොලිස් ස්ථානය දැනුවත් කිරීමෙන් පසු වැඩිදුර විමර්ශන සිදුකර 2025.12.05 වන අද දින මෙම පහරදීමට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 38 හා 42 වයස්වල පසුවන කඩුවෙල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් 2025.12.05 වන අද දින කඩුවෙල ගරු මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු 2025.12.19 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. කඩුවෙල පොලිසි වැඩිදුර විමර්හන සිදුකරන ලදී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**